DOI: https://doi.org/10.4038/p.v14i1.25

*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 14-Iss. I, Jun. 2023, 29-39.*

# ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය පිළිබඳ මධුපිණ්ඩික සූත්‍රය ඇසුරෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

# [An Investigative Study of Sensory Perception through the Discoursed Madhupiṇḍika Sutta]

**Medawachchiye Sanghananda**[1]

## Abstract

The ultimate purpose of Buddhism is to convince the liberation for the beings freed from the circle of birth which is suffering. Buddhism has given the priority to investigate the knowledge to accomplish the Nibbāna. The Indian thinkers had followed three ways to accomplish the knowledge identified as traditionalist, rationalist, and empiricist. The ones who followed the path of listening to achieve knowledge are known as traditionalists. The ones who followed the path of logic to achieve knowledge are known as rationalists. The empiricists are known as the ones who follow the sensory perception to achieve knowledge. Buddhism also remarks on the sensory perception to achieve knowledge. Buddhism paves the way to achieve knowledge through empiricism and the perception is twofold: sensory perception and extra sensory perception. The research problem is to investigate the characteristics of sensory perception in Buddhism through the discoursed Madhupiṇḍika Sutta. The research methodology is referred to as the bibliography research method, and using the primary and secondary sources collecting and analyzing the data. According to the Madhupiṇḍika Sutta, dependent on the eye & forms, eye consciousness arises. Subsequently, the contact, feeling, perception, thinking and *papañca* arises. It is essential to have without impairment of functions to raise the sensory perception. Buddhism asserts that reality cannot be achieved through sensory perception because the person grasps the truth as false and false as truth. Through sensory perception, a person cannot achieve the ultimate truth. This is the nature of sensory perception.

**Keywords:** Perception, Buddhism, Sensory Perception, Person, Papañca

1 Temporary Tutor, Department of Buddhist and Pali Studies, Bhiksu University of Sri Lanka.

Received: 3 January 2023, Accepted revised version: 5 May 2023.

This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## හැඳින්වීම

ඥාන ගවේෂණය යනු දර්ශනයේ මූලිකාංගයකි. මෙය පෙරදිග හා අපරදිග දර්ශනයේ බෙහෙවින් සාකච්ඡාවට බඳුන් වූ මාතෘකාවකි. ඥානයත්, දර්ශනයත් අතර පවතිනුයේ වෙන් කළ නොහැකි සබැඳියාවකි. බටහිර දර්ශනයට අයත් ග්‍රීක යුගයේ දී ඥානය පිළිබඳව කරනු ලැබූ මූලික විග්‍රහයන් හඳුනාගත හැකි ය. ඇරිස්ටෝටල් හා ප්ලේටෝ වැනි දාර්ශනිකයින් ඉදිරිපත් කළ විග්‍රහයන්ට අනුව ඥානය සියලු දෙනා ම අවබෝධ කර ගත යුතු වැදගත් මාතෘකාවකි. නූතන යුගයේ දාර්ශනිකයන්ගේ අවධානය යොමු වූයේ මිනිස් ඥානය පිළිබඳ ව පැවති ගැටලු මෙම යුගයේ බහුලව දර්ශනය තුළින් ඉදිරිපත් කිරීමයි. ඒ අනුව ඥානය යනු කුමක් ද? එය ලබාගන්නේ කෙසේ ද? ඥානයේ සීමා කවරේ ද? යනාදි දාර්ශනික ගැටලු මෙම යුගයේ බහුලව සාකච්ඡා වූ අතර, ඒ සඳහා පර්යේෂණයන් ද අත්හදා බලා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස බුද්ධිවාදය හා අනුභූතිවාදය බිහි විය.

බුද්ධිවාදියා සත්‍ය දැනගැනීම සඳහා තර්කමය බුද්ධිය වැදගත් කොට සලකයි. තර්කානුකූලව සිතා බැලීමෙන් යමක සත්‍යාසත්‍යභාවය දැනීම සඳහා තර්කය සතුටුදායක ඥානෝපායක් වශයෙන් තීරණය කිරීමට හැකි බව ඔවුහු සලකති. (ඤාණසුමන හිමි, 2006: 132). බටහිර දාර්ශනික ක්ෂේත්‍රය තුළ ප්‍රකට බුද්ධිවාදීන් ලෙස රෙනේ ඩේකාට් (ක්‍රි. ව. 1632 - 1637), බෙනඩික් ස්පිනෝසා (ක්‍රි. ව. 1649 - 1617), විල්හෙල්ම් ලෛබිනිස් (ක්‍රි. ව. 1649 - 1617) හැඳින්විය හැකි ය. (විමලඤාණ හිමි, 2015: 39).

විශ්වය තුළ පවත්නා සියල්ල ප්‍රත්‍යක්ෂය මූලික කොට අර්ථවත් වේ යන සිතුවිල්ල අනුභූතිවාදි චින්තන සම්ප්‍රදායේ වැදගත් ඉගැන්වීමයි. බේකන් සහ හොබ්ස්ගේ දාර්ශනික පැහැදිලි කිරීම් ඔස්සේ සිය අදහස් දක්වන ජෝන් ලොක් බුද්ධිවාදි දාර්ශනික අදහස් ප්‍රතික්ෂේප කරනු ලබයි. උපතේ දී මිනිස් සිත හිස් පිරිසිදු පුවරුවකට සම කළ හෙතෙම සංවේදනය හා ප්‍රත්‍යවේක්ෂණය යන මාර්ග ඇසුරෙන් අප ලබන විවිධ අත්දැකීම් ඔස්සේ දැනුම නිර්මාණය වන බව දක්වයි. මේ හේතුව නිසා ම ඩේකාට් විසින් ගෙනෙන ලද සහජ සංකල්පවාදය යම් අර්බුදයකට ලක් වන බවක් පෙනේ. අප ඉන්ද්‍රියයන් බාහිර ලෝකය ඇසුරෙන් සංවේදනය වන්නා වූ විවිධ වස්තූන් ආශ්‍රිත ප්‍රත්‍යක්ෂයන් අප මනසට ඇතුළු කරනු ලැබේ. මෙම ප්‍රත්‍යක්ෂයන් මාර්ග කොට ගෙන අප මනසෙහි විවිධ සංකල්ප නිර්මාණය වෙයි. ප්‍රත්‍යවේක්ෂණය ලෙස හඳුන්වනු ලබන අප මනසේ අභ්‍යන්තරික ක්‍රියාදාමයන් සේ සැලකෙන ප්‍රත්‍යක්ෂය, සංශය, තර්කනය වැනි දෑ මෙම සංකල්ප නිර්මාණකරණයට ඉවහල් වෙයි. මීට අමතර වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික ගුණ යනුවෙන් සංකල්ප නිර්මාණකරණයට සහය වන අවශේෂ කාරණා ද්වයක් ද පවතියි. ද්‍රව්‍ය වස්තුවකට අයත් හැඩය, චලනය, ශක්තිමත් බව හා ව්‍යාප්තිය යන ප්‍රාථමික ගුණ ද, ඒ ඇසුරෙහි වන වර්ණය, ශබ්දය, රසය වැනි ද්විතීයික ගුණයන් ද අප ප්‍රත්‍යක්ෂණයට ගෝචර වීම මගින් සරල සංකල්ප නිර්මාණය වෙයි. ඒවා යලි යළිත් මෙනෙහි කිරීමෙන් ද, සෙසු සංකල්ප හා සංසන්දනය කිරීමෙන් ද සංකීර්ණ සංකල්ප නිර්මාණය වෙයි. භෞතික තත්වයන්ට අමතර වශයෙන් ආධ්‍යාත්මික දෑ ද පවතින බව ලොක්ගේ පිළිගැනීමයි. මේ නිසා අනුභූතිමය බවට අමතරව යම් විඥානවාදී ස්වභාවයක් විද්‍යමාන කරන බවක් ද මෙම දර්ශනය තුළ දැකිය හැකි වේ.

සංකල්පවාදය අගයන බර්ක්ලේ ද අනුභූතිවාදී දර්ශන සම්ප්‍රදාය නියෝජනය කරන්නා වූ නූතන දාර්ශනිකයෙකි. හෙතෙම සංකල්ප මනසේ පවත්නා බවත්, ඒවා ප්‍රත්‍යක්ෂය මූලික කොට පවත්නා බවත් දක්වයි. යමක පැවැත්මෙහි සාරය නම් ප්‍රත්‍යක්ෂය බව Esse is percipi බර්ක්ලේගේ අදහසයි. සංකල්පනයට ස්වෛරී පැවැත්මක් නොමැති බවත්, මනස නො පවතී නම්

වස්තුවක පැවැත්මක් ද නොමැති බවත් ඔහුගේ පිළිගැනීමයි. තමාට ප්‍රත්‍යක්ෂය නො වන විටත්, තමාගේ මනසෙහි නො පවතින විටත් යමකට පැවැත්මක් නොමැති බව ඔහු අවධාරණය කරයි. මින් හෙතෙම ජෝන් ලොක්ගේ භෞතික ලෝකය ඛණ්ඩනය කිරීමක් සිදු කරන බවක් පෙනෙයි. එසේ ම අනුභූතිවාදී ආකල්පයන්ගෙන් ඔබ්බට ගොස් ලොක් සේ ම විඥානවාදි බවක් දර්ශනයට එක් කිරීමට තැත් කරන ආකාරයක් ද දැකිය හැකි වේ.

ඩේවිඩ් හ්‍යුම් අප විසින් අනුභූතිය ඇසුරෙන් ලබන ප්‍රත්‍යක්ෂය මානසික සංකල්ප බවට පත්වන බවත්, හේතුඵලභාවය අතර අවශ්‍ය සම්බන්ධතාවක් නිර්මාණය නො වන බවත්, එය හුදෙක් පුරුද්ද මත ගොඩනැගෙන්නා වූ විශ්වාසයක් පමණක් බව දක්වයි. මිනිස් සිත විවිධ ප්‍රත්‍යක්ෂයන්ගේ ඒකරාශීත්වයක් බවත්, ඒ හැරුණුකොට ඉන් නියෝජනය කෙරෙන කිසියම් වස්තුවක් නොමැති බවත් හ්‍යුම් අවධාරණය කරයි. එසේම පාරභෞතික සංකල්ප කෙරෙහි වන ප්‍රත්‍යක්ෂ අප වෙත නො පවතින බැවින් ද, ප්‍රත්‍යක්ෂය ඔස්සේ විවරණය නො වන බැවින් ද, ඒවා හුදු මතයක් පමණක් නියෝජනය කරනු ලබන බව හ්‍යුම්ගේ අදහසයි.

ඒ අනුව ඥානය ලබාගැනීම සඳහා ප්‍රත්‍යක්ෂය ඉවහල් වන බව අනුභූතිවාදීන් ප්‍රකාශ කළහ. බටහිර දර්ශන ක්ෂේත්‍රයේ දාර්ශනිකයන් වන ජෝන් ලොක් (ක්‍රි. ව. 1632 - 1704), ජෝර්ජ් බාක්ලේ (ක්‍රි. ව. 1685 - 1753), ඩේවිඩ් හියුම් (ක්‍රි. ව. 1711 - 1770) යන තිදෙනා ප්‍රධාන අනුභූතිවාදීන් ලෙස හැඳින්විය හැකිය. (විමලඤාණ හිමි, 2015: 39).

'ප්‍රත්‍යක්ෂය' යන වචනයෙහි වචනාර්ථ විග්‍රහය මුලින් ම විමසා බැලීම යෝග්‍ය වේ. ඒ අනුව ප්‍රත්‍යක්ෂය යන්නෙන් අත් දුටු, පැහැදිලිව පෙනෙන, පසක්වන, නො සැඟවුණු, ස්ව සිද්ධිය, ඉබේ වැටහෙන සත්‍ය, අත් දැකීම යන අරුත් ඇති බව මහා සිංහල ශබ්දකෝෂයේ සඳහන් වේ. (විජයතුංග, 1999: 657). ප්‍රති + අක්ෂ එකතු වී නිර්මාණය වී ඇති ප්‍රත්‍යක්ෂය යන්නෙන් ඉන්ද්‍රියන්ට හමු වූ දහම්, කල්පනයෙන් තොර වූ අභ්‍රාන්ත වූ ඉන්ද්‍රිය ඥානාදිය යන අරුත් ගම්‍ය වන බව සුමංගල ශබ්දකෝෂයේ දැක් වේ. (සෝරත හිමි, 1999: 657). අවබෝධය, වටහාගැනීම, පැහැදිලි වීම, පසක් වීම යන අරුත් දනවන බව බෞද්ධ ශබ්දකෝෂයේ සඳහන් වේ. එහි ම ප්‍රත්‍යාක්ෂාවබෝධය යනුවෙන් හඳුන්වා ඇත්තේ තමන් අත්දැකීමෙන් ලද වැටහීම, මනා සේ දැනීම යන්නයි. එමෙන් ම පාලි - සිංහල අකාරාදියේ දැක්වෙන්නේ නුවණින් විමසා බැලීම ප්‍රත්‍යක්ෂය බවයි. (බුද්ධදත්ත හිමි, 1998: 344).

ප්‍රත්‍යක්ෂය යන්නට ඉංග්‍රීසියෙන් යෙදෙන වචනය වනුයේ Perception යන්නයි. ඒ තුළින් සංජානනය, ප්‍රත්‍යක්ෂය, හැඳිනගැනීම, ඉන්ද්‍රියාවබෝධය, ප්‍රත්‍යක්ෂ ඥානය යන අරුත් හඟවන බව මලලසේකර ශබ්දකෝෂයේ දැක් වේ. (මලලසේකර, 1999: 1296). ඇස් ඉදිරිපිට ඇති, පෙනෙන්නට තිබෙන, පැහැදිලි, කෙළින්ම, වහාම, නියමාකාර යන අරුත් ඇති බව සංස්කෘත ශබ්දකෝෂයක දැක් වේ. (සෝරත හිමි හා ඤාණවිමල හිමි, 1999: 443). හින්දු තර්ක ශාස්ත්‍රයට අනුව චක්ෂුරාදී ඉන්ද්‍රියන් හා රූපාදී අරමුණු ගැටීමෙන් උපන් ඥානය ප්‍රත්‍යක්ෂය යන බවයි. එය නිර්විකල්පික ප්‍රත්‍යක්ෂය හා සවිකල්පික ප්‍රත්‍යක්ෂය යනුවෙන් දෙයාකාර ය. හැඩහුරුකමක් සහිතව වැටහීම සවිකල්පික ප්‍රත්‍යක්ෂය වන අතර, එසේ නොමැතිව වන වැටහීම නිර්විකල්පික ප්‍රත්‍යක්ෂයයි. (පියනන්ද හිමි, 2002: 83).

**සාහිත්‍ය විමර්ශන**

ආචාර්ය දෙල්දූවේ ඤාණසුමන හිමියන් විසින් (1980) රචනා කරන ලද ආදි බෞද්ධ දර්ශනයේ මූලධර්ම නම් ග්‍රන්ථයේ පිටු අංක 132 සිට 153 දක්වා වෙන් වී ඇත්තේ බුදුදහමේ ඇති අනුභූතිවාදී ලක්ෂණ පෙන්වීම සඳහා

ය. එහි දී තර්කය වැඩි වශයෙන් බුදුදහමේ ප්‍රතික්ෂේප කර ඇති අවස්ථා පිළිබඳව දක්වා ඇති අතර, ඉන්ද්‍රිය හා අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයන් පිළිබඳ ව ද සාකච්ඡා කර ඇත. නමුත් මෙහි ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය පිළිබඳ දීර්ඝ විස්තරයක් දැක ගත නො හැකි ය.

S. R. Bhatt and Anu Mehrotra විසින් (1939) රචිත Buddhist Epistemology නම් ග්‍රන්ථයේ දැක ගන්නට ලැබෙන්නේ මහායාන බුදුදහමේ ඥානය සම්බන්ධ තොරතුරු පමණි. එහි මුල් බුදුදහමේ ඥානය සම්බන්ධ තොරතුරු දක්නට නොමැත.

ආචාර්ය කඩවත්ගම පියරතන හිමියන් විසින් (1999) රචිත බෞද්ධ දර්ශනය හා මතවාද විමර්ශනය යන කෘතියෙහි පළමු පරිච්ඡේදය වෙන් වී ඇත්තේ ඥානමීමංසාව පිළිබඳ බෞද්ධ ආකල්පය වෙනුවෙනි. එම කෘතියෙහි වැඩි අවධානයක් යොමු වී ඇත්තේ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය කෙරෙහි ය.

**පර්යේෂණ ගැටලුව**

බුදුදහමේ සඳහන් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයේ ස්වභාවය කෙබඳු ද?

**පර්යේෂණයේ අරමුණ**

බුදුදහමේ ඉගැන්වෙන ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය මජ්ඣිමනිකායේ මධුපිණ්ඩික සූත්‍රය ඇසුරෙන් විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍යතම අරමුණ වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා භාවිත කරනු ලබන ක්‍රමවේදය වන්නේ ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදයයි. ගුණාත්මක දත්ත මත පදනම් වූ පර්යේෂණයක් සිදු කිරීමේ අදිටනින් ප්‍රාථමික මූලාශ්‍රයන් හා ද්විතීයික මූලාශ්‍රය මගින් දත්ත රැස් කරමින්, එම දත්ත විශ්ලේෂණය කරමින් මෙම පර්යේෂණය සිදු කරනු ලැබේ.

**පර්යේෂණයේ වැදගත්කම**

ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය සම්බන්ධයෙන් බුදුසමය දක්වා ඇති ආකල්පය මධුපිණ්ඩික සූත්‍රය ඇසුරින් අධ්‍යයනය කිරීමට හැකි වීම මෙම පර්යේෂණයේ වැදගත්කමයි.

**සාකච්ඡාව**

ක්‍රිස්තු පූර්ව 06 වෙනි සියවසට පූර්ව ප්‍රාග් බෞද්ධ චින්තාවලියේ දී අනේක ශාස්තෲමූල විවිධ ගුරුකුල පැවති බවට දෙසැට දෘෂ්ටියෙන් බ්‍රහ්මජාල සූත්‍රය, දස දෘෂ්ටි අග්ගිවච්චගොත්ත සූත්‍රය, චතුර් දෘෂ්ටි අචේල කස්සප සූත්‍රය, ත්‍රිත්ව දෘෂ්ටි මහා තිත්ථායන සූත්‍රය හා කච්චායන සූත්‍රය, දස දෘෂ්ටි කාළාම සූත්‍රය ලෙසින් කම්සැප විඳීම, දැඩිලෙස දුක්දීම යන ද්විත්ව යෝගයෙන් පරිපූර්ණ ආත්මවාදී සංකල්පය පිළිබඳ බෞද්ධ සූත්‍ර විෂද කරයි.

බුදුසමය පහළ වන සමයේ භාරතීය දර්ශන චින්තාවේ දාර්ශනිකයන් ඥාන ගවේෂණය සම්බන්ධයෙන් කොටස් තුනකට බෙදී සිටියේ ය. එම කොටස් තුන සැකෙවින් දක්වන්නේ නම්,

1. සම්ප්‍රදායවාදීන් (අනුස්සවිකා)
2. බුද්ධිවාදීන් (තක්කීවීමංසි)
3. අනුභූතිවාදීන් (සාමඤ්ඤෙව ධම්මං අභිඤ්ඤාය) යනුවෙනි.

මෙයින් තුන් වැනි කොටසට මම ද ඔවුන් අතරින් අයෙක්මියි (තෙසා හමස්මි) යනුවෙන් බුදුන් වහන්සේ ප්‍රකාශ කර ඇත. ආදි බුදුදහමේ ප්‍රකට වන අනුභූතිවාදී ප්‍රවණතාව අපට අවස්ථා දෙකක දී ම වටහා ගත හැක. එනම්, අනුභූතිවාදයට ප්‍රතිපක්ෂ බුද්ධිවාදී පිළිගැනීම විචාරයට ලක් කරන අවස්ථා සහ අනුභූතිවාදී ලක්ෂණවලින් යුක්ත අවස්ථා යන දෙකේ දී ය. (ඥාණසුමන හිමි, 2006: 132).

බුද්ධිවාදීන්ගේ ඥානය සෙවීමේ අවිය වූයේ

තර්කයයි. බුදුන් වහන්සේ තර්කය ප්‍රතික්ෂේප කළ අවස්ථා සඟි සාහිත්‍යයේ දැකගත හැක. තර්ක කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලය සත්‍යය යැයි පිළිගැනීම නිෂ්ඵල ක්‍රියාවකි. තර්ක කිරීමෙන් එළඹෙන නිගමන හතරක් බුදුසමය පෙන්වා දී ඇත. එනම්,

1. හරියාකාරව තර්ක කර හරි නිගමනවලට එළඹීම (සුතක්කිතං යථා)

2. හරියාකාරව තර්ක කර වැරදි නිගමනවලට එළඹීම (සුතක්කිතං අඤ්ඤථා)

3. වැරදියට තර්ක කර හරි නිගමනවලට එළඹීම (දුතක්කිතං යථා)

4. වැරදියට තර්ක කර වැරදි නිගමනවලට එළඹීම (දුතක්කිතං අඤ්ඤථා) (ම. නි. 2, සන්දක සුත්තඃ 322).

සත්‍යය අවබෝධ කරගත් බුදුන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වීම පිණිස බරණැස ඉසිපතන මිගදායට වැඩම කරන අවස්ථාවේ දී අතරමග හමුවන උපක ආජීවකයා බුදුන් වහන්සේගෙන් විමසනුයේ ඔබවහන්සේ කවරෙක් ද? කවරෙක් උදෙසා පැවිදි වූයේ ද? නුඹ වහන්සේගේ ශාස්තෘවරයා කවරෙක් ද? යනුවෙනි. එවිට බුදුන් වහන්සේ උපක ආජීවකයාට පවසා සිටියේ, ''මම සියල්ල ඉක්ම වූවෙක්මි, සියල්ල දත්තෙමි, සියලු ධර්මයන්හි නො ඇලුනෙක්මි. තෘෂ්ණාව ක්‍ෂය කිරීමෙන් මිදුණෙක්මි. මා විසින් ම සත්‍යය අවබෝධ කරගෙන තිබිය දී කවරෙකු උදෙසා පැවිදි වූයේ යැයි කියම් ද? මට ආචාර්යවරයෙක් නැත. මා හා සමාන අයෙකු ද නැත. දෙවියන් සහිත ලෝකයේ මට ප්‍රති පුද්ගලයකු ද නැත. මම ලෝකයේ අරහත් වෙමි. මම නිරුත්තර වූ ශාස්තෘ වෙමි. එකම සම්‍යක් සම්බුද්ධ වූ මම, කෙලෙස් ගිනි නිවීමෙන් සිහිල් වූයෙමි, නිවුනේ වෙමි.''

''සබ්බාභිභූ සබ්බවිදූ හමස්මි - සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො - සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං?''

''න මෙ ආචරියො අත්ථි - සදිසො මෙ න විජ්ජති සදෙවකස්මිං ලොකස්මිං - නත්ථි මෙ පටිපුග්ගලො''

''අහං හි අරහා ලොකෙ - අහං සත්ථා අනුත්තරො එකොම්හි සම්මා සම්බුද්ධො - සීති භූතොස්මි නිබ්බුතො'' (ම. නි. 1, අරියපරියේසන සුත්තඃ 414).

යථෝක්තව සඳහන් කරන්නට යෙදුණු කරුණු තුළ අන්තර්ගත වී තිබූ ''සයං අභිඤ්ඤා'' යන පදය බුදුසමයේ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය හා බැඳී පවතින්නකි. අන්‍ය ආගම්වල විමුක්තිය පාර ලෞකික ය. මරණින් පසු ලැබෙන්නෙකි. එම නිසා එම ඉගැන්වීම් තර්කයට ගෝචර අධි භෞතික ලක්ෂණවලින් වඩාත් ම යුක්ත වෙයි. බෞද්ධ නිවන මෙලොව දී ම ලැබිය යුත්තක් සේ දක්වන නිසා එය පැහැදිලිව ම අනුභූතියට ගොදුරු වෙයි. නිරෝධ සමාපත්තියට සම වැදීමෙන් එම නිවන් සුව මෙලොව දී ම වින්දනය කිරීමට හැකි ය. එය පැහැදිලි අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයකි. (ඤාණසුමන හිමි, 2006ඃ 152).

යථෝක්ත කරුණු අධ්‍යයනය කිරීමේ දී ස්ඵුට වනුයේ ඥානය ලබාගැනීමේ ආදි බෞද්ධ ඉගැන්වීම් ආනුභූතික ප්‍රවණතාවකින් යුක්ත බව ය. ඒ අනුව ආදි බුදුසමයේ ඥානය ලබා ගැනීමේ මාර්ගය ලෙස ප්‍රත්‍යක්ෂය පෙන්වාදෙයි. එම ප්‍රත්‍යක්ෂය

1. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය

2. අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය

යනුවෙන් දෙයාකාර වේ. ප්‍රත්‍යක්ෂය පිළිබඳ ඉගැන්වීම් මජ්ඣිම නිකායේ මූලපරියාය සූත්‍රය, මහාතණ්හාසංඛය සූත්‍රය හා මධුපිණ්ඩික සූත්‍රය වැනි සූත්‍රාන්තයන් තුළ දැකිය හැකි ය. ප්‍රත්‍යක්ෂය පිළිබඳ බෞද්ධ විග්‍රහය මධුපිණ්ඩික සූත්‍රය ඇසුරෙන්

විමංසනය කිරීම අර්ථාන්විත වේ.

**ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය**

සද්ධර්මයේ මූලික අරමුණ නිර්වාණාවබෝධය මගින් සංසාරගත නිවෘත්තිය සලසාලීමයි. නිර්වාණාවබෝධයෙහිලා ශ්‍රාවකයා තුළ අභිප්‍රේරණයක් ඇති වීම පිණිස සත්වයාගේ ස්වභාවය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ ඇති තතු හැඳිනගැනීම අත්‍යවශ්‍ය ය. සත්වයාගේ සංසාර ප්‍රවර්තනය හේතු-ඵල සැකැස්ම තේරුම් ගැනීම සංසාර වෘත්තිය පිළිබඳ නිරෝධ රටාව හැඳිනගැනීමට අවශ්‍ය මූලික ප්‍රත්‍යයයි. බුදුරජාණන් වහන්සේ නොමග වසා නිර්භයව, සුවදායක ලෙස, ප්‍රීතිමත්ව යා හැකි ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වූ සුරක්ෂිත මාර්ගය විවෘත කරන ලද බව වදාරන්නේ, දුක ගොඩනැගෙන ආකාරය දන්නේ නම් සසුන් මග වැඩීම පහසු වන බැවිනි. (ම. නි. 1, ද්වේධාවිතක්ක සුත්තඃ 298). එහෙයින් මෙහි දී සත්වයාගේ සංසාර ක්‍රියාවලිය නිරතුරු පෝෂණය කරන ඉන්ද්‍රිය ඥානයත්, ප්‍රපංචකරණයත් හැඳිනගත යුතු වේ.

ඉන්ද්‍රිය යන්නෙන් ඇස, කණ, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රිය සයෙනුත්, ශ්‍රද්ධා, ස්මෘති, සමාධි, වීර්ය, ප්‍රඥා යන ඉන්ද්‍රිය ධර්ම පහෙනුත්, අධිපති බව, මෙහෙයවීමේ ශක්තිය යන අරුත් ගම්‍ය වේ. (වීරසේකර, 1968ඃ 78). පුද්ගලයා යනු සංවේදී ඉන්ද්‍රියයන් සමූහයකින් සමන්විත නිතර ම ඉන්ද්‍රියයන් ඇසුරෙන් ක්‍රියාත්මක වන සජීවී ප්‍රාණියෙකි. මෙම ඉන්ද්‍රියයන් නො බිඳී පවතින තුරු විවිධ අරමුණු ඒවාට ගෝචර වන අතර, පුද්ගලයා විවිධ අයුරින් එම අරමුණු ග්‍රහණය කර ගනී. මෙලෙස විවිධ අරමුණු ඉන්ද්‍රියයන් මගින් ග්‍රහණය කර ගැනීමේ ක්‍රියාවලිය ඉන්ද්‍රිය සංජානනය හෙවත් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය ලෙස නූතන මනෝවිද්‍යාවේ හඳුන්වා ඇත.

පෙරා'පර දෙදිග දර්ශන සම්ප්‍රදායන්හි ප්‍රත්‍යක්ෂය යන්නෙහි පසුබිම හා පදනම සකස් වන්නේ ඉන්ද්‍රිය මාර්ග කොටගෙන ය. මිනිස් සිරුර හා සම්බන්ධ පංචේන්ද්‍රියන්ගෙන් එනම්, ඇස, කණ, නාසය, දිව, ශරීරය යනාදියෙනි. පිළිවෙළින් පෙනීම, ඇසීම, ආඝ්‍රහණය, රසය හා ස්පර්ශයන් ප්‍රත්‍යක්ෂ කර ගනී. එමගින් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ඥානයක් ලබා ගනී. බෞද්ධ විග්‍රහය තුළ මෙම පංචේන්ද්‍රිය ම පිළිගන්නා අතර මනස ද වෙනම ඉන්ද්‍රියයක් ලෙස ක්‍රියා කරන බව අවධාරණය කොට ඇත. ඒ අනුව බෞද්ධ විග්‍රහයේ දී පංචේන්ද්‍රියන්ට අමතරව මනස නමැති ඉන්ද්‍රිය ද එකතු කොට අනෙකුත් දාර්ශනිකයන්ගේ ඉන්ද්‍රිය ඉගැන්වීමෙන් ඔබ්බට ගොස් ෂඩේන්ද්‍රියක් පිළිබඳ කරුණු දක්වා ඇත. 'මනස' නමැති ඉන්ද්‍රියට අරමුණු වන්නේ 'ධම්ම' යන්නයි. මනස සෙසු ඉන්ද්‍රියයන්ගෙන් ලැබෙන අරමුණු සම්බන්ධයෙන් සම්බන්ධීකරණය කිරීම සහ කළමනාකරණය සිදු කරනවාට අමතරව ස්වාධීන ඉන්ද්‍රියක් ලෙසට ද ක්‍රියාත්මක වේ. ඒ අනුව අනෙකුත් ඉන්ද්‍රියයන්ගෙන් විෂය අරමුණු නො ලබන විට දී වුව ද මනස හෙවත් මන නිරපේක්ෂ ඉන්ද්‍රියයක් ලෙස ක්‍රියාත්මකව ඉන්ද්‍රිය ඥාන විභාගය ක්‍රියාවට නංවයි.

පුද්ගල සන්තානයෙහි චෛතසික ක්‍රියාකාරීත්වය සඳහා මූලික වන විඤ්ඤාණක්ෂේත්‍ර දොළහක් සූත්‍ර සාහිත්‍යයෙහි දැකිය හැකියි. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන වශයෙන් අජ්ඣත්තික ආයතන සයකුත්, රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම වශයෙන් බාහිර ආයතන සයකුත් විඤ්ඤාණක්ෂේත්‍ර සේ ඉදිරිපත් වේ. (ම. නි. 3, ඡබ්බිසෝධන සුත්තඃ 146). පුද්ගල මනසේ සංකල්ප ජනිත වන්නේ මේ අජ්ඣත්තික ආයතනයන්ගේ හා බාහිර ආරම්මණයන්ගේ සම්බන්ධතාව මතයි.

රූප ශබ්දාදී වශයෙන් ප්‍රකට වනුයේ ආනුභවික ලෝකයයි. එය ඉඳුරන් මගින් ග්‍රහණය කරගැනීම අනුභූතියයි. අජ්ඣත්තික ආයතන හා බාහිර අරමුණු එක් වීමෙන් පමණක් ඉන්ද්‍රිය ඥානය පුද්ගලයාට

ලැබෙන්නේ නැත. චක්ඛු විඤ්ඤාණය ලැබීම සඳහා කරුණු තුනක් සම්පූර්ණ විය යුතු ය. එනම්,

1. නොබිඳුණු ඇසක් තිබීම

2. බාහිර ආරම්මණයන්ගේ පැමිණීම

3. අදාළ මෙනෙහි කිරීම (ම. නි. 1, මහාහත්ථිපදෝපම සුත්තං 460).

යනුවෙනි. ඉහත සඳහන් පරිදි ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ඥානය සංවිධානය වීම සඳහා මූලික කරුණු තුනක සුසංයෝගය අත්‍යවශ්‍ය ය. ඉන් පළමුවැන්න නොබිඳුණු ඉන්ද්‍රියක් තිබීමයි. එනම්, ඇස, කණ ආදී ඉන්ද්‍රියයන්ගේ විකෘතිතාවක් නොවීමයි. මෙම කාරණාවන් සෝත, ඝාණ, ජිව්හා, කාය, මන යන සෙසු ඉන්ද්‍රියන්ට ද අදාළ වන්නේ ය. මෙම කාරණාවන් සම්පූර්ණ වූ තැන විඤ්ඤාණභාගයාගේ පහළ වීම සිදු වෙයි. සංඥා, වේදනා වශයෙන් තවදුරටත් අත්දැකීම් වින්දනය නො කරන අවස්ථාව ලෙස මෙම විඤ්ඤාණ අවස්ථාව හැඳින්විය හැකිය.

බුදුදහමේ ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් වන්නේ ඒ පිළිබඳ හුදු ශාස්ත්‍රීය විවරණයක් කිරීමේ අදහසකින් නො වේ. බුදුදහමේ මූලික අවධාරණය වූ දුක පටිච්චසමුප්පන්නව නිෂ්පන්න වන ආකාරය පැහැදිලි කිරීමේ දී ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලිය ඍජුව ම සම්බන්ධ වේ. දුක ඇතිවන ආකාරයත්, එය දුරුකර ගත හැකි ආකාරයත් පැහැදිලි කිරීම සඳහා අදාළ වන හා ප්‍රමාණවත් පරිද්දෙන් ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයක් බෞද්ධ මූලාශ්‍රවල ඇතුළත් වේ.

ඉන්ද්‍රියට අරමුණක් ගොදුරු වීමෙන් අනතුරුව ඒ පිළිබඳ දැනුමක් පහළ වීම බෞද්ධ විග්‍රහයට අනුව එකවර සිදු වන්නක් නොවෙයි. එය පියවර කිහිපයක් ඔස්සේ දිවෙන සංකීර්ණ මානසික ක්‍රියාවලියකින් පසුව සිදුවන්නකි. ඉන්ද්‍රියකට අරමුණක් මුණගැසීමේ මූලික අවස්ථාවේ පටන් සිදුවන මෙම ක්‍රියාවලිය පිළිබඳ පැහැදිලි විස්තරයක් මධුපිණ්ඩික සූත්‍රයේ දැක්වෙයි.

"ඇස ද රූප ද නිසා චක්ඛු විඤ්ඤාණය පහළ වේ. මේ තුනේ එකතු වීම ස්පර්ශයයි. ස්පර්ශය ප්‍රත්‍ය කොට විඳීම් හටගනී. යමක් විඳී ද එය සංජානනය කරයි. යමක් සංජානනය කරයි ද එය විතර්කය කරයි. යමක් විතර්කය කරයි ද එය ප්‍රපංචනය කරයි. ප්‍රපංචනය වීම හේතු කොට ගෙන අතීත, අනාගත, වර්තමාන කාලවලට අයත් ඇසින් දත යුතු රූපයන්හි දී පුද්ගලයා අභිභවනය කරයි."

චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා. යං වෙදෙති තං සඤ්ජානාති. යං සඤ්ජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති. යං පපඤ්චෙති තතො නිදානං පුරිසං පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති අතීතානාගතපච්චුප්පන්නෙසු චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු (ම. නි. 1, මධුපිණ්ඩික සුත්තං 280).

මෙම විස්තර කිරීමට අනුව ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලිය ආරම්භයේ දී අභ්‍යන්තර ඉන්ද්‍රිය හෝ බාහිර විෂය අරමුණු යන දෙකෙන් එකක් වඩා ප්‍රමුඛ වන්නේ නැත. මේ දෙකට ම එක හා සමාන වැදගත්කමක් හිමි වී ඇත. මේ දෙක ම එකිනෙකට උපකාරී ව ක්‍රියාකරයි. මේ දෙකේ එකිනෙක ආධාරය මත ඉන්ද්‍රිය ඥාන හෙවත් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය ආරම්භ වේ. මෙලෙස ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියක් ආරම්භයේ දී අභ්‍යන්තර ඉන්ද්‍රියයත් බාහිර විෂය අරමුණත් එක හා සමාන වැදගත්කමකින් සැලකීම බෞද්ධ විග්‍රහයේ විශේෂතාවක් වන අතර, පූර්ණ විඥානවාදී හෝ කේවල අනුභූතිවාදී ස්ථාවරයන්ට පත් නොවී සිටින්නට බුදුසමයට ඒ අනුව හැකියාව ලැබේ.

එසේ ම මෙම ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය පිළිබඳ මෙම විග්‍රහය මගින් එම ක්‍රියාවලිය

පිළිබඳ ක්‍රියාත්මක වන ආත්මයක් වැනි අධිභෞතික පදාර්ථයක් ගම්‍ය වන්නේ ද නැත. භාරතීය චින්තනය තුළ මුල් බැසගෙන තිබෙන සංකල්පයක් වන ආත්ම සංකල්පය විෂද කිරීමට ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාකාරීත්වය යොදාගෙන ඇත. දැනුම ලබන්නේ සහ ඉඳුරන්ට ලැබෙන අරමුණුවල සාක්ෂිකරු වන්නේ ඒ පුද්ගලයා සතු 'ආත්මන්' නමැති අධිභෞතික පදාර්ථය බව උපනිෂද් චින්තනයේ දැක් වේ. එසේ ම බටහිර බුද්ධිවාදී දාර්ශනික සම්ප්‍රදායන් තුළ ද cogito, transcendental, apperception වැනි සංකල්ප මගින් ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලියට හේතුභූත වන අධිභෞතික පදාර්ථයන් ගැන අදහස් ඉදිරිපත් වී ඇත. බෞද්ධ විග්‍රහය තුළ මෙම ක්‍රියාවලිය පටිච්චසමුප්පන්න ප්‍රවාහයක් ලෙස ඉදිරිපත් වී ඇත. බෞද්ධ විග්‍රහයෙන් කියවෙන්නේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියකට එවැනි අධිභෞතික පදාර්ථයක් අත්‍යවශ්‍ය වනවා නොව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියේ සංකල්ප මැවීමේ පියවරයන්හි ප්‍රතිඵලයක් ලෙස එවැනි අධිභෞතික සංකල්පයක් පුද්ගලයා තුළ පහළ වන බවයි.

ඉහත දැක් වූ සූත්‍ර පාඨයට අනුව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියේ අනුපූර්ව අවස්ථාවන් මෙසේ ය. නිරෝගී අභ්‍යන්තර ඉන්ද්‍රියකුත්, සුදුසු විෂය අරමුණකුත් මුණගැසුණු විට එම ඉන්ද්‍රියානුසාරී විඤ්ඤාණය පහළ වෙයි. ආයතනය, ආරම්මණය හා විඤ්ඤාණය එකතු වීමෙන් ඇති වනුයේ ඵස්ස හෙවත් ස්පර්ශය යි. ඉන් අනතුරුව එම ඵස්සය ඇසුරු කරගෙන වින්දනය හටගනී. විෂය අරමුණේ ස්වභාවය අනුව සුඛ, දුක්ඛ හෝ මධ්‍යස්ථ හෙවත් අදුක්ඛමසුඛ වින්දනය පහළ වේ. විෂය අරමුණ පිළිබඳ යම් හැඳින ගැනීමක් කරන්නේ ඊළඟ අවස්ථාවේ ය. එය සංජානනය ලෙස දැක්වේ. එලෙස හැඳින ගැනීමෙන් අනතුරුව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය අවසන් වන්නේ නැත. එලෙස හැඳින ගන්නා දේ අනතුරුව විතර්කනය කරයි. එනම්, ඒ පිළිබඳ විවිධ අර්ථකථන කරයි. විෂය වස්තුව පිළිබඳ විවිධ තීරණ ගනියි. ඉන් අනතුරුව විෂය වස්තුව පිළිබඳ ප්‍රපංච ගොඩනගයි. එනම්, සාමාන්‍ය සිතිවිලිවලින් එහා ගිය තණ්හා, මාන, දිට්ඨි යන කෙළෙස් ගොඩ නැගෙන පරිදි චින්තනය මෙහෙයවීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රපඤ්ච සඤ්ඤා සංඛා මනස තුළ ගොඩනැගේ. එනම් ප්‍රපංචනය හරහා මනසේ ගොඩනැගුණු සංකල්පයෝ ය. එම සංකල්පයන් පසුව ඉදිරි ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ අවස්ථාවල දී පුද්ගලයාට බලපායි. විෂය වස්තුවක් නැවත අවස්ථාවක හැඳින ගැනීමේ දී හා අර්ථකථනය කිරීමේ දී එලෙස ප්‍රපංචනය හරහා ගොඩනැගුණු සංකල්ප පුද්ගලයාට බලපෑම් එල්ල කරයි.

**ප්‍රපංචකරණය**

මෙහි විස්තර වන ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියේ පියවර හැඳින්වීමට භාවිත කර ඇති යෙදුම් හැම එකක් ම ගැඹුරු මනෝවිද්‍යාත්මක අර්ථවලින් සමන්විත ය. බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායන්හි ධර්මාභිධර්ම විශ්ලේෂණයෙහිලා සුවිශේෂී විග්‍රහයන්ට තුඩුදුන් ධර්ම පර්යායක් වන්නේ 'පපඤ්ච' යන්නයි. ඊට හේතුව එම වචනය සම්බන්ධ දාර්ශනිකාර්ථ ක්‍රියාකාරීත්වයේ විශිෂ්ඨත්වයයි. පශ්චාත්කාලීන මහායාන බෞද්ධ දාර්ශනිකයන් සියල්ලෝ ම මෙම වචනය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ අයුරු මහායාන ධර්ම ග්‍රන්ථ සමීක්ෂණයෙන් පෙනේ. බෞද්ධ දාර්ශනිකයන් පමණක් නොව හින්දු දාර්ශනිකයන් විසින් ද මේ වචනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඇත.

සූත්‍ර ප්‍රදේශයන්හි 'පපඤ්ච' ශබ්දය විවිධ වාග් පරිසරයන්හි විවිධ ස්වරූපයෙන් පෙනී සිටියි. විටෙක ක්‍රියා පද හෝ ක්‍රියා රූපයක් ලෙසින් ද (පපඤ්චෙති, පපඤ්චයන්තා, පපඤ්චිත), විටෙක සමාස පදයක කොටසක් ලෙසින් ද (පපඤ්චසඤ්ඤා, පපඤ්චසංඛා, පපඤ්චසඤ්ඤාසංඛා, පපඤ්චසඤ්ඤාසංඛාසමුදාචරණ, පඤ්ඤත්ති, පපඤ්චසංඛා පහාන, පපඤ්චවූපසම, ඡින්නපපඤ්ච, පපඤ්චාරාම,

පපඤ්චරති) එය දක්නට ලැබෙන අතර, ඇතැම් සන්දර්භයක් තුළ එහි ප්‍රති ශබ්දය ද ඒ හා සමග ම යෙදී තිබෙනු පෙනෙයි (නිප්පපඤ්ච, නිප්පපඤ්චපද, නිප්පපඤ්චපථ, නිප්පපඤ්චාරාම, නිප්පපඤ්චරති, අප්පමඤ්චං). (ඤාණානන්ද හිමි, 2015: 01). 'පපඤ්ච' යන්නෙහි අර්ථය ලෙස මජ්ඣිම නිකායට්ඨකථාවේ දක්වා ඇත්තේ ඒ මත්ත ප්‍රමත්තාකාරයෙන් පවතින්නා වූ තණ්හා, දිට්ඨි, මාන යන්නට අධි වචනයක් බවයි.

පපඤ්චොති මත්ත පමත්තකාරභාවෙන පවත්තානං තණ්හාදිට්ඨිමානානං එතං අධිවචනං (ම. නි. 2. අට්ඨකථා, චූළසීහනාද සුත්තවණ්ණනා: 09).

'ප්‍ර' පූර්ව 'පඤ්ච්' ධාතුවෙන් නිපන් එය විස්තාරය, විහිදී යාම, පැතිරීයාම, විවිධත්වයට පත්වීම යන අරුත් දනවයි. සංකල්ප තුළ ඇති 'අතු - ඉති - විහිදී යාමේ' ප්‍රවණතාව යටකී අර්ථ සියල්ලට ම පොදු ලක්ෂණයකි. (ඤාණානන්ද හිමි, 2015: 04). එමෙන්ම 'පපඤ්ච' යන්නෙන් ප්‍රමාදය, කල්ගත කිරීම, ප්‍රමාදයට හේතු වූ කෙළෙස් යන අරුත් ප්‍රකට කරන බවත්, 'පපඤ්චේති' යන්නෙන් විස්තර කිරීම, ප්‍රමාද කිරීම යන අරුත් දනවන බව පාලි - සිංහල අකාරාදියේ දැක්වේ. (බුද්ධදත්ත හිමි, 1998: 306).

මධුපිණ්ඩික සූත්‍රයේ දැක්වෙන වෛඥානික ඉන්ද්‍රිය ක්‍රියාවලිය විතර්කයෙන් පසුව පුද්ගල චිත්ත සන්තානය තුළ ප්‍රපංචයන් ගොඩනගයි. අට්ඨකථා විග්‍රහයට අනුව ප්‍රපංච නිර්මාණය වන්නේ තෘෂ්ණාව, මානය හා දෘෂ්ටිය පදනම් කරගෙන ය. එය මගේ ය (එතං මම) යනුවෙන් ගැනීම තණ්හාවයි. ඒ මම වෙමි (එසො හමස්මි) යනුවෙන් ගැනීම මානයයි. ඒ මාගේ ආත්මයයි (එසො හමස්මි) යනුවෙන් ගැනීම දෘෂ්ඨියයි. මෙබඳු ක්‍රියාකාරිත්වයකින් යුක්ත අශ්‍රැතවත් පුහුදුන් පුද්ගලයා ලොව ඇති තතු ඒ පරිද්දෙන් නො දකියි. සංකල්පීය නිර්මාණ තුළින් ලෝකය විපරීත ලෙස ග්‍රහණය කරගනියි. සියලු දුක්, දොම්නස්, ගැටුම්වල පැවැත්ම මේ ප්‍රපංචකරණය නිසා ම සිදු වේ.

පුද්ගලයාගේ සන්තානගත වූත්, සමාජගත වූත්, අනේකවිධ ගත වූත් අනේකවිධ දුක්ඛ දොමනස්ස ආදීන්ගේ මූල සාධකය හෙවත් හට ගැනීම ලෙස බුදුදහම පෙන්වා දෙන්නේ තෘෂ්ණාවයි. පුද්ගලයා සංසාරික භව චක්‍රයේ ගමන් කරනුයේ තෘෂ්ණාව පාදක කරගෙන ය. ලෝකය ස්වභාවයෙන් ම සැප, සම්පත්, වස්තු, සම්භාර, සොම්නස් සහගත දේ පිළිබඳව මදිකමින් යුක්ත ව තෘප්තිකර තත්වයෙන් අනූනව කාලය ගත කරයි. මොන දේ ලැබුණත් ඔහුට කිසි විටෙකත් ඇතිවීමක් නැත. හෙතෙම තණ්හාවේ දාසයෙක් බවට පත් වී විවිධ ආශාවන් සපුරා ගැනීමේ වෑයමක නිරතව සිටියි (ඌනො ලොකො අතිත්ථො තණ්හා දාසො). (ම. නි. 2, රට්ඨපාල සුත්ත: 440).

පුද්ගලයා දුකට, සන්තාපයට, පසුතැවීමට, දෘෂ්ටි ගහනයට මෙන් ම සාංසාරික බන්ධනයන්ට පත්වීමට මූලික හේතුව වන්නේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය මගින් පුද්ගල සන්තානය තුළ ජනිත වන්නා වූ විපරීත බුද්ධියයි. චක්ෂු ආදී ඉන්ද්‍රියන්ට රූපාදී අරමුණු විෂය වීමෙන් චක්ෂු ආදී විඤ්ඤාණයන් පහළ වේ. ඉන්ද්‍රියන් හා අරමුණු ද ඒවාට අනුරූප වූ විඤ්ඤාණය ද එක් වූ කල්හි ස්පර්ශය හට ගනී. ස්පර්ශය හේතුවෙන් සංවේදනය ඇතිවේ. ඒ හේතුවෙන් සංජානනයත්, අනතුරුව විතර්කයත් හටගනියි. ප්‍රපංචකරණය ඇති වනුයේ ඉන් පසුව ය. මේ ආකාරයෙන් අතීත, අනාගත හා වර්තමාන සියලු අරමුණු විෂයෙහි පුද්ගල සන්තානය තුළ ප්‍රපඤ්ච සඤ්ඤා සංඛාර ඇති වේ. මේ අනුව පශ්චාත් ආනුභූතික චෛතසික ක්‍රියාකාරීත්වයෙහිලා ප්‍රතීත්‍යසමුත්පන්න ස්වරූපයක් විග්‍රහ වේ. චක්ෂු විඤ්ඤාණය වශයෙන් පුද්ගලයන් ලබනුයේ අනුභූතියයි. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය පිළිබඳව මෙම විවරණයෙහි අවස්ථා තුනක් දැක්වේ. එය භාෂා ප්‍රයෝගයෙන් ද දැක ගත හැකිය. මේ තුළින් බුදුන් වහන්සේගේ

මනෝවිද්‍යාව පිළිබඳ විශාරදත්වය පමණක් නොව භාෂා භාවිතය පිළිබඳ අවබෝධය ද ප්‍රකට වේ.

1. වේදනා අවස්ථාව දක්වා ඇති ප්‍රතීත්‍ය සමුප්පන්න අවස්ථාව.

චක්ඛු, විඤ්ඤාණ, වේදනා යන අවස්ථා තුන පුද්ගලයාට සිය අභිමතය පරිදි පාලනය කළ නො හැකි පියවර තුනකි. අදාළ හේතු සාධක ඇත්නම් ඒවායේ පහළවීම ඒකාන්ත ය.

2. සංජානන අවස්ථාවේ සිට ප්‍රපංච අවස්ථාව තෙක් පුද්ගලයා ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලිය මෙහෙයවන අවස්ථාව.

වේදනාවෙන් පටන් ගෙන තර්කනය දක්වා වූ ක්‍රියාවලිය ප්‍රතීත්‍යසමුත්පාදය ප්‍රකාශ කරන භාෂාව එනම්, 'වෙදනා පච්චයා තණ්හා' යන්න වෙනුවට කතෘකාරක භාෂාවෙන් එනම්, 'යමක් වේදනය කරන්නේ ද එය දැනගනියි' යනුවෙන් විස්තර කෙරේ. මේ අයුරින් භාෂාව වෙනස් කිරීමෙන් බුදුන් වහන්සේ අර්ථ නිරූපණය කර ඇත්තේ වේදනය ඇති වන අවස්ථාවේ දී මිනිසා කතෘත්වය ආරෝපණය කරන ආත්මයක් ගැන විශ්වාසය ජනිත කරවන බවයි. එම ක්‍රියාවලිය අවසන් වන්නේ ප්‍රපංච ඇතිකර වීමෙන් ය.

3. ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලිය යටතේ නිපදවන ප්‍රපඤ්ච සඤ්ඤා සංස්කාරවල යටත් වැසියකු ලෙස පුද්ගලයා පත්වන අවස්ථාව.

පුද්ගල ස්වාභිමතය පරිදි මානසික ක්‍රියාකාරීත්වය මෙහෙයවිය නො හැකි මේ අවස්ථාවේ පුද්ගලයා එයට යටත් වන බව ද බුදුදහම පිළිගනියි. එහි දී කර්තෘත්වය පුද්ගලයාගෙන් ගිලිහී ගොස් පුද්ගලයා කර්මකාරකයෙක් බවට පත් වේ. (අස්සජි හිමි, 2015: 131).

මිනිසාගේ සිතේ නිරන්තරයෙන් ම බලපාන ත්‍රිවිධ අකුසල මූල වන ලෝභය, ද්වේෂය හා මෝහය නිසා යමක් හරි හැටි අවබෝධ කරගැනීම වසා දමයි. මෙම හැඟීම්වලට වැසී සිටීමේ ස්වභාවයක් සාමාන්‍ය මිනිස් චින්තනයෙන් දක්නට ලැබෙයි. චිත්තයේ විපරීත බව නිසා ම සාවද්‍ය දෙය නිරවද්‍ය දෙය ලෙසත්, නිරවද්‍ය දෙය සාවද්‍ය දෙය ලෙසත් දකියි. (පියරතන හිමි, 1999: 12). මෙම මානසික ව්‍යාකුලත්වය නිසා ම පුද්ගලයා අසාර දේ සාර දේ හැටියටත් (අසාරෙ සාර මතිනො), සාර දේ අසාර දේ හැටියටත් (සාරෙ චා සාරදස්සිනො) ගැනීම මිථ්‍යා ඥානය ලෙසත් (මිච්ඡා සංකප්ප ගොචරා), සාර දේ සාර දේ හැටියටත් (සාරඤ්ච සාරතො ඤත්වා), අසාර දේ අසාර දේ හැටියටත් (අසාරඤ්ච අසාරතො) ගැනීම සම්මා ඥානය ලෙසත් (සම්මා සංකප්ප ගොචරා) බුදුසමය අවධාරණය කර සිටියි. (ධම්මපද, යමක වග්ග: 11, 12 ගාථා). පුද්ගලයා මෙම සාර අසාර ධර්මයන් වැරදි අයුරින් ග්‍රහණය කරගන්නේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයේ බලපෑමෙනි. එම නිසාවෙන් පුද්ගලයාට පරිපූර්ණ අවබෝධයක් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළින් ජනිත කරගැනීමට නො හැකි වෙයි.

## නිගමනය

අප යම් අත්දැකීමක් ලබන විට දී ඉන්ද්‍රිය අත්දැකීමට සම්බන්ධ පූර්වයෙන් අප තුළ ප්‍රපංච හරහා ගොඩනැගුණු සංකල්ප සඳහා ප්‍රබල බලපෑමක් කරන බව පෙනේ. විෂය වස්තුවක් අප හැඳිනගන්නේ මෙම සංකල්පවල බලපෑමෙනි. එම නිසා බොහෝවිට පුද්ගලයාට විෂය වස්තුවේ සැබෑ ස්වභාවය දකින්නට අවස්ථාව නො ලැබේ. පූර්වයෙන් මනසේ ගොඩනැගුණු දේ හා මුසුව විෂය වස්තුව ඇති සැටියෙන් හැඳින ගන්නට මගපෙන්වයි. මේ අනුව පුද්ගලයා විසින් ඉන්ද්‍රියානුසාරයෙන් ලබන දැනීම යථාර්ථය නො වන බවත්, මායාවක්, දෘෂ්ටි ග්‍රහණයක් බවත් සූත්‍ර මගින් විවරණය කරන බව පෙනේ. පුද්ගලයා ඉන්ද්‍රිය මගින් ලබන්නාවූ ප්‍රත්‍යක්ෂය යථාර්ථවාදයට ප්‍රමාණවත් නො වන බවත්, පුද්ගලයා

දුකට පත්වීමට උපස්ථම්භයක් වන බවත් බුදුසමය වැඩිදුරටත් විස්ථාරණය කරනු ලබයි. බුදුසමය ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් නො නැවතී අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය කරා පුද්ගලයාව උත්සුක කරනු ලබන්නේ පරිපූර්ණ ඥානය අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් ලබා ගත හැකි නිසාවෙනි. මෙය බෞද්ධ ඥාන විභාගයේ සුවිශේෂත්වය ලෙස ද පෙන්වා දිය හැකිය.

## මූලාශ්‍රය

### ප්‍රාථමික මූලාශ්‍රය


*මජ්ඣිම නිකාය 1.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිම නිකාය 2.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිම නිකාය 3.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.


### ද්විතීයික මූලාශ්‍රය


ඥාණසුමන හිමි, දෙල්දූවේ. (2006). *ආදි බෞද්ධ දර්ශනයේ මූලධර්ම.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඥාණානන්ද භික්ඛු, කටුකුරුන්දේ. (2015). *සංකල්පය හා යථාර්ථය.* පොත්ගුල්වල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය.

*පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨ කථා 2.* (2014). කොළඹ 10: සෝමාවතී හේවාවිතාරණ අරමුදල.

පියනන්ද මහ ස්ථවිර, දික්වෙල (2002). *තර්ක සංග්‍රහ ව්‍යාඛ්‍යාව.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පියරතන හිමි, කඩවත්ගම (1999). *බෞද්ධ දර්ශනය හා මතවාද විමර්ශනය.* කැළණිය: ශ්‍රී බෝධිරුක්ඛාරාමය.

විමලඥාණ හිමි, නාඹටුන්නේ. (2015). *බුද්ධිවාදී චින්තනය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Bhatt, S. R. and Mehrotra, Anu. (2000). *Buddhist Epistemology*. Delhi: Motilal Banarsidass Publishers Privatr Limited.

Keith A. Berriedale. (1979). *Buddhist Philosophy in India and Ceylon*. Delhi: Oriental Books Reprint Corporation.


### සඟරා


අස්සජි හිමි, ගඟුරේවේ. (2015). 'ඥානය ලබාගැනීම පිළිබඳ බෞද්ධ ආකල්පය.' *ශාස්ත්‍ර ලෝචන.* මහකුඹුක්වැවේ නන්දාලෝක හිමි. මංගල කලාපය. 131.


### කෝෂ ග්‍රන්ථ


බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ. (1998). *පාලි - සිංහල අකාරාදිය.* කොළඹ 11: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

මලලසේකර, ජී. පී. (1999). *සිංහල - ඉංග්‍රීසි ශබ්දකෝෂය.* කොළඹ 11: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ලියනගේ, සිරි. *බෞද්ධ ශබ්දකෝෂය.* කතෘ ප්‍රකාශනයකි.

විජයතුංග, හරිස්චන්ද්‍ර. (සම්). (1999). *ගුණසේන මහා සිංහල ශබ්ද කෝෂය.* කොළඹ 11: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

වීරසේකර, ගුණපාල. (සම්). (1968). *පාලි - සිංහල - ඉංග්‍රීසි ශබ්ද කෝෂය.* කොළඹ 11: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සෝරත හිමි, වැලිවිටියේ. (සංස්). (1999). *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය* (ද්විතීයික භාගය). කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝරත හිමි, වැලිවිටියේ, ඥාණවිමල හිමි, බෙල්ලන. (1999). *සිංහලාර්ථ සහිත සංස්කෘත ශබ්දාර්ණවය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.